| | | |
|---|---|---|
| **3 ශ්‍රේණිය** | **වලස්මුල්ල අධ්‍යාපන කලාපය.**<br>දෙවන වාර පරීක්ෂණය - 2018<br>**පරිසරය** | කාලය පැය 1 යි. මි. 30 යි. |

නම -.............................................................................................

පාසල.............................................................................................

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. **පහත සඳහන් වාක්‍ය හරිනම් ✓ ලකුණද වැරදිනම් × ලකුණද යොදන්න.**

i. ජාතික ගීයට, පාසල් ගීයට අපි ගරු කළ යුතුය. ( )

ii. පැළෑටියක් වැඩීමට ජලය අවශ්‍ය නොවේ. ( )

iii. ගොයම් ගසට මුදුන් මුලක් ඇත. ( )

iv. නිදහස් උත්සවය සමරන්නේ පෙබරවාරි මාසයේ ය. ( )

v. ආහාර ගන්නා අවස්ථාවේ එහා මෙහා ඇවිදීම යහ පුරුද්දකි. ( )

vi. අහිතකර දුම් පරිසරයට මුදා හැරීම වාහන භාවිතයේ දී සිදු කරන අයහපත් ක්‍රියාවකි. ( )

vii. කැලෑ එළි පෙහෙලි කිරීම නිසා වර්ෂාව වැඩි වේ. ( )

viii. අපරාධ කරුවන් ඇල්ලීම, මත් ද්‍රව්‍ය සොයා ගැනීම බල්ලා සතු සුවිශේෂ හැකියාවකි. ( )

ix. ක්ලාන්තය සෑදුණු රෝගියෙකුට වහාම කළ යුතු වන්නේ වතුර පෙවීම ය. ( )

x. සිහින් දිගටි කොළ ඇති ශාකයකි කොට්ටම්බා. ( )

(ලකුණු 20)

02. **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. කෝවිල තම ආගමික ස්ථානය වන ජන වර්ගයාට ආවේණික ආහාරයකි.
   i. වටලප්පන් ii. තෝසේ iii. කිරිබත්

2. පන්ති කාමරයේ දී වැඩ පහසු කර ගැනීමට යොදා ගන්නා උපකරණයක් නොවන්නේ,
   i. පංචරය ii. කතුර iii. දෑකැත්ත

3. ඕනෑම වයසක පසුවන අයෙකුට වුවද වැදගත්ම ආහාර වේල වන්නේ,
   i. දවල් ආහාරය ii. උදෑසන ආහාරය iii. රාත්‍රී ආහාරය

4. සෙවණ සහිත පරිසරයක වැඩෙන ශාකයකි.
   i. පතොක් ii. ගොයම් iii. ඇන්තූරියම්

5. කෙනෙකුගෙන් තවත් කෙනෙකුට බෝ විය හැකි රෝගයක් නොවන්නේ,
   i. දියවැඩියාව ii. වෛරස් උණ iii. සෙම්ප්‍රතිශ්‍යාව

6. ආඩියා ළිඳ බහුලව භාවිතා කරන ප්‍රදේශයකි.
   i. මාතර ii. හම්බන්තොට iii. යාපනය

7. අතීතයේ ජලය පිරිසිදු කරගත් ක්‍රමයක් නොවන්නේ,
   i. උණු කර නිවා ගැනීම ii. ක්ලෝරීන් යෙදීම iii. ඉඟිනි ඇට දැමීම

8. මෙම රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,



i. නැටි මැස්ම

ii. බ්ලැන්කට් මැස්ම

iii. දම්වැල් මැස්ම

9. පදික මාරුවෙන් පාර මාරු වන අවස්ථාවක පළමුවෙන් බැලිය යුතු වන්නේ,
i. වම් පැත්ත ii. දකුණු පැත්ත iii. ඉදිරිපස

10. ආරක්ෂාව සඳහා තම ශරීරයේ පැහැය වෙනස් කරගත හැකි සත්ත්වයා වන්නේ,
i. ඉබ්බා ii. කටුස්සා iii. පත්තෑයා

11. ළමාලියෝ මල් ගවසා වරල පිට
දමා කරට මුතුපොට අත වළලු වට

මෙම කවියේ ඇතුළත් නැටුම සඳහා භාවිතා කරන උපකරණයක් වන්නේ,
i. දෑ කැත්ත ii. කළ ගෙඩිය iii. කුල්ල

12. කිසිවෙකු හට කතුරක් දෙනු ලබන නිවැරදි ආකාරය මින් කුමක්ද?

i.  ii.  iii. 

13. ජලයේ වැඩෙන ශාකයක් වන්නේ මින් කුමක්ද?
i. සේර ii. සැල්විනියා iii. උඩ වැඩියා

14. මෙම සංඥා පුවරුවෙන් අදහස් කරන්නේ,



i. පදිකයන් මාරුවන ස්ථානය

ii. වාහන නතර කිරීම තහනම්

iii. නිශ්ශබ්දව ගමන් කරන්න.

15. වාහනයක තිරිංග තද කළ විට දැල්වෙන ලාම්පුවෙහි වර්ණය වන්නේ ,
i. රතු ii. කොළ iii. කහ

30
(ලකුණු 30)

3. **ගැළපෙන ලෙස දෙපස යා කරන්න**

| | |
|---|---|
| i. වෙනත් අයෙකු දියේ ගිලීම | කළු පුල්ලි සෑදේ |
| ii. නිවසේ දී විය හැකි අනතුරකි | ශරීරයේ වර්ධනය අඩුවේ |
| iii. පොල් බෑයක් නරක් වූ විට | උදවු ඉල්ලා කෑ ගැසීම |
| iv. පැළ සිටුවා ගැනීමේ ක්‍රමයකි | සුරතල් සතුන් සපා කෑම |
| v. මිශ්‍ර ආහාර වේලක් නොගැනීමෙන් | තවාන් දැමීම |

(ලකුණු 15)

4. පහත දැක්වෙන පින්තූරවලට අදාළ පිළිතුර කොටුව තුළින් තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| අමරදේව ශූරීන්, | ආඩියා ළිඳ, | සුසන්තිකා ජයසිංහ, |
| ආනන්ද සමරකෝන්, | මරතොන්ඩි සැරසිලි, | |

i. 

ii. 

.................................................... ....................................................

iii. 

iv. 

.................................................... ....................................................

v. 

....................................................

(ලකුණු 15)

5. **පිළිතුරු සපයන්න.**

1. මිනිසුන් එදිනෙදා කටයුතු වලට ජලය සපයා ගන්නා ක්‍රම දෙකක් ලියන්න.

i.......................................................................................................................................

ii.......................................................................................................................................

2. ආහාර නරක් වූ විට දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

i.......................................................................................................................................

ii.......................................................................................................................................

3. ගස්වැල් වලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

i.......................................................................................................................................

ii.......................................................................................................................................

4. අනතුරු සිදුවිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න.

i.......................................................................................................................................

ii.......................................................................................................................................

5. ඔබේ පාසල අයත් පළාතේ නම ලියන්න.

.......................................................................................................................................

6. මිනිසුන්ට රෝග බෝ කරන සතුන් දෙදෙනෙක් නම් කරන්න.

i.......................................................................................................................................

ii.......................................................................................................................................

(ලකුණු 20)

**පිළිතුරු පත්‍රය** **පරිසරය** **3 ශ්‍රේණිය**

1. i. ✓
   ii. ✗
   iii. ✗
   iv. ✓
   v. ✗
   vi. ✓
   vii. ✗
   viii. ✓
   ix. ✗
   x. ✗

2. 1. ii
   2. iii
   3. ii
   4. iii
   5. i
   6. iii
   7. ii
   8. ii
   9. ii
   10. ii
   11. ii
   12. i
   13. ii
   14. i
   15. i

3. i. උදවු ඉල්ලා කෑ ගැසීම
   ii. සුරතල් සතුන් සපා කෑම
   iii. කළු පුල්ලි සෑදීම
   iv. තවාන් දැමීම
   v. ශරීර වර්ධනය අඩුවීම

4. i. ආනන්ද සමරකෝන්
   ii. මරතොන්ඩ් සැරසිලි
   iii. සුසන්තිකා ජයසිංහ
   iv. ආඬියා ළිඳ
   v. අමරදේව ශූරීන්

5. i. ළිඳ/ආඬියා ළිඳ/වැව/පතහ/ගංගා/ඇළ/දොළ/පීල්ල/ජල නළය/නළ ළිං (මින් දෙකක්)

   ii. දුගඳ/ඇලෙන ගතිය/පාට වෙනස් වීම/පණුවන් සිටීම/ගුල්ලන් සිටීම/පුස් වර්ග තිබීම (මින් දෙකක්)

   iii. සිසිලස ලැබීම/හිරුරැස් වලින් ආරක්ෂා වීම/ගෘහ භාණ්ඩ තැනීමට දැව ලබා දීම/නිවාස තැනීමට අමු ද්‍රව්‍යයන් වශයෙන් යොදා ගැනීම/සතුන්ගේ වාසස්ථාන වශයෙන් යොදා ගැනීම (මින් දෙකක්)

   iv. වසා නොදැමූ පතල්/ආවරණය නොකරණ ලද ළිං වළවල්/ගංගා (ගැඹුරු ස්ථාන, කිඹුලන් බහුල ස්ථාන)/අනාරක්ෂිත ගස්/ලඳු කැලෑ/දිය සෙවල බැඳුණු ගල් ඒ දඬු (මින් දෙකක්)

   v. දකුණු පළාත

   vi. මදුරුවා/ගෙමැස්සා/බල්ලා/පූසා/මීයා/වඳුරා/මැක්කා/කිනිතුල්ලා/ලේනා (මින් දෙදෙනෙක්)